ජනතා වතු සංවර්ධන මණ්ඩලය - 2012

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය ව්‍යාවනය

මෙම වාර්තාවේ 1.2.7 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

මණ්ඩලයට අයත් වතු17 අතුරින් වතු 16 ක් අඛණ්ඩව අලාභ ලැබීම මත මණ්ඩලයේ ශුද්ධ වත්කම් 2012 දෙසැම්බර් 31 දින වන විට රු.252,874,366 දක්වා අඩු වී තිබුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව මෙම ශුද්ධ වත්කම්වල අඩුවීම සියයට 45 ක් වූ අතර මෙම තත්ත්වය මත භාණ්ඩාගාරයේ හෝ රජයේ වෙනත් මූල්‍ය සහායක් නොමැතිව මණ්ඩලය පවත්වාගෙන යෑම අවිනිශ්චිත තත්ත්වයක පවතී.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නියමිත ක්ෂය ප්‍රතිපත්ති හා අනුපාත යොදා ගනිමින් අදාල ක්ෂය ගණනය කිරීම් සිදු කර නොමැති බැවින් අයිතම් 04 කට අදාලව රු.72,041,092 ක ඌන ක්ෂය වෙන්කිරීමක් සිදුකර තිබුණි.

(ආ) ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ පාලනයෙන් බැහැර ඔනුගල්ඔය වතුයායෙහි ස්ථාවර වත්කම් ලෙස රු.6,013,927 ක් මූල්‍ය ප්‍රකාශ තුල දක්වා තිබුණි.

(ඇ) බදුකුලී ගිවිසුමට අනුව වර්ෂයකට අදාල බදුකුලී රු.7,140,000 ක් වුවද සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස හඳුනාගෙන ඇත්තේ රු.1,379,728 ක් පමණි. ඒ අනුව බදුකුලී ආදායම රු.5,760,272 ක් අඩුවෙන් ගිණුම්ගතවීම නිසා අලාභය එම ප්‍රමාණයෙන් වැඩි වී තිබුණි.

(ඈ) ජනතා වතු සංවර්ධන මණඩලයේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ කොටසක් බදුදීම වෙනුවෙන් 2009 වර්ෂයේ සිට 2011 සැප්තැම්බර් දක්වා අයවිය යුතු විදුලි වියදම රු.224,063 ක් විය. මෙම වියදම අවසන් ගිණුම් මගින් අයවිය යුතු ගාස්තුවක් වශයෙන් පෙන්වා නොතිබුණි.

(ඉ) වතු අතර සිදුවන අන්තර් ගනුදෙනු වාර්තා කිරීම සඳහා පවත්වාගෙන යන අන්තර් වතු හුවමාරු (Inter Estate Transaction) ලෙජර් ගිණුම තුලනය විය යුතු වුවත් 2012 දෙසැම්බර් 31 දිනට රු.11,344,825 ක හර ශේෂයක් පැවතුණි.

1.2.3 නොසැසඳූ පාලන ගිණුම්

පාරිතෝෂික වෙන් කිරීමේ ගිණුම හා පාරිතෝෂික ගණනය කිරීමේ උපලේඛන අතර රු.48,923,381 ක වෙනසක් තිබුණි.

1.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 දෙසැම්බර් 31 දිනට වැට හා ආරක්ෂක ලාම්පු වත්කම් ගිණුමේ ශේෂය රු.602,065 ක් වුවත් 2012 ජනවාර් 01 දින ලෙජරයේ ඉදිරියට ගෙනා ශේෂය රු.454,088 ලෙස දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ 2010 වර්ෂයේ අවසන් ගිණුම් අනුව ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් අයවිය යුතු මුදල රු. 52,412,573 ක් ලෙස දක්වා තිබුණද ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ ගිණුම් වලට අනුව 2010 සිට ආයෝජන මණ්ඩලයට ගෙවිය යුතු කිසිඳු අගයක් දක්වා නොතිබුණි.

(ඇ) මූල්‍ය ආයතනයක් සමඟ වූ මූල්‍ය කල්බදු ගිවිසුම් වගකීම් වලට අදාල ලෙජර් ගිණුමේ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.136,160 ක බැර ශේෂයක් වූ අතර, ආයතනයේ අදාළ ලිපිගොනු හා ලේඛන අනුව 2012 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වගකීම් වටිනාකම රු.4,500,000 ක් විය.

1.2.5 අවිනිශ්චිත ගිණුම්

පහත සදහන් අවිනිශ්චිත ගිණුම් දීර්ඝ කාලයක් තිස්සේ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(අ) වතුයායන් 2 කට අදාළව අවිනිශ්චිත ගිණුම් 2 ක හර ශේෂයන්ගේ එකතුව රු.2,353,300 ක්ද, වතුයායන් 6 කට අදාලව අවිනිශ්චිත ගිණුම් 6 ක බැර ශේෂයන්ගේ එකතුව රු.3,925,888 ක් විය.

(ආ) කන්දල්ඔය වතුයායේ 2009 වර්ෂයේ සිට පොදු ලෙජරයේ පවත්වාගෙන එනු ලබන තොග මිලදීගැනීමේ අවිනිශ්චිත (Stock Purchase Suspense) ගිණුමෙහි 2012 දෙසැම්බර් 31 දිනට රු.2,735,704 ක හර ශේෂයක් පැවතුණි.

(ඇ) ප්‍රධාන කාර්යාලයේ ලෙජරයේ පැවති අවිනිශ්චිත ගිණුමේ රු.1,158,171 ක බැර ශේෂයක් විය.

1.2.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව හලාවත වැවිලි සමාගමෙන් බදුකුලී ලෙස අයවිය යුතු රු.4,000,000 ක් අයවී නොතිබූ අතර, මෙම මුදල අයකර ගැනීම සම්බන්ධයෙන් ජනවසම හා හලාවත වැවිලි සමාගම අතර එකගතාවයක් නොතිබුණි.

(ආ) රහතුන්ගොඩ වතුයායේ අමු තේ දළු Rossling hill කර්මාන්ත ශාලාවට ලබාදීම වෙනුවෙන් 2006 වසරේ සිට අයවිය යුතු රු.555,890 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.2.7 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැති වීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට හෝ නොහැකි විය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| (අ) ජංගම නොවන වත්කම් | 2,095,927,194 | (i) උපලේඛන<br>(ii) ස්ථාවර වත්කම් ලේඛනය<br>(iii) සමීක්ෂණ මණ්ඩල වාර්තා<br>(iv) හිමිකම් සහතික පත්‍ර |
| (ආ) ක්ෂය වෙන්කිරීම් | 377,872,062 | ගණනය කිරීමේ උපලේඛන |
| (ඇ) අවසාන තොගය | 101,346,656 | තොග සමීක්ෂණ වාර්තා |
| (ඈ) වෙළඳ ලැබිය යුතු | 145,831,182 | (i)උපලේඛන<br>(ii)ශේෂ සනාථ කිරීම් |
| (ඉ) අත්තිකාරම්, තැන්පතු සහ ඉදිරි ගෙවීම් | 22,037,639 | (i)උපලේඛන<br>(ii)ශේෂ සනාථ කිරීම් |
| (ඊ) ලැබිය යුතු රඳවාගත් බදු | 8,997,513 | බදු සහතික |
| (උ) විවිධ ණය ගැතියෝ | 342,975,525 | (i) උපලේඛන<br>(ii) ශේෂ සනාථ කිරීම් |
| (ඌ) ගැලපුම් ගිණුම | 36,289,472 | (i) ජ'නල් වවුචර් හා උපලේඛන<br>(ii) කාල විශ්ලේශණ |

| | | |
|---|---|---|
| (එ) සේවක අර්ථසාධක අරමුදල/ සේවක භාරකාර අරමුදල/ ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක සංගමය/වතු සේවක අර්ථසාධක සංගමය | 625,670,242 | උපලේඛන |
| (ඒ) පාරිතෝෂිත වෙන්කිරීම් | 745,185,629 | උපලේඛන |
| (ඔ) රාජ්‍ය බැංකුවක ණය ශේෂය | 22,970,326 | ශේෂ සනාථ කිරීම් |

### 1.2.8 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති,රීති,රෙගුලාසියට යොමුව | අනුකූල නොවීම පිළිබඳ විස්තර |
|---|---|---|
| (අ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත | උපයන විට බදු ගණනයේදී මූල්‍ය නොවන ප්‍රතිලාභයන් සැලකිල්ලට ගෙන නොතිබුණි. |
| (ආ) | 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත | සෑම කාර්තුවක්ම අවසන් වී ඊළඟ මස 20 දිනට පෙර ගෙවීම් කළයුතු වුවද 2012 දෙසැම්බර් 31 දිනට එකතුවූ ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු ප්‍රමාණය රු.6,137,904 ක් වූ අතර, එය 2013 අගෝස්තු 14 දින වන විටත් ගෙවා නොතිබුණි. |
| (ඇ) | 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත | බාහිර ආයතන වෙතින් අයකරගත් ජාතිය ගොඩනැගීමේ බදු 2012 වර්ෂය තුළදී රු.2,941,359 ක් විය. මෙය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත | එක් එක් මාසය සඳහා වූ දායක මුදල් ඊළඟ මාසය අවසන් වීමට පෙර සේවක අර්ථසාධක අරමුදලට ප්‍රේෂණය කළයුතු වුවත් ප්‍රධාන කාර්යාලයේ හා වතු අංශයේ සේවක අර්ථසාධක දායක මුදල් රු.382,371,113 ක් ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඉ) | 1980 අංක 46 දරන සේවානියුක්තිකයන්ගේ | එක් එක් මාසය සඳහා වූ දායක මුදල් ඊළඟ මාසය අවසන් වීමට පෙර සේවා නියුක්තිකයන්ගේ භාරකාර |

| | | |
|---|---|---|
| | භාරකාර අරමුදල් පනත | අරමුදලට ප්‍රේෂණය කළයුතු වුවද ප්‍රධාන කාර්යාලයේ හා වතු අංශයේ සේවකයන් වෙනුවෙන් වූ දායක මුදල් රු.29,141,216 ක් ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඊ) | මුදල් රෙගුලාසි | |
| | (i) මු.රෙ 135 | මූල්‍ය බලතල සීමාවන් නිලධාරීන් වෙත පවරා නොතිබුණි. |
| | (ii) මු.රෙ 187(3) | දෛනිකව ලැබෙන ආදායම් මුදල් එදිනම හෝ ඊට පසු දින බැංකු ගතකළ යුතු වුවද අවස්ථා 10 කදී එසේ දෛනිකව ලැබූ ආදායම් මුදල් බැංකු ගත කිරීම දින 03 සිට 21 අතර කාල පරාසයක ප්‍රමාද කර බැංකුගත කර තිබුණි. |
| | (iii) 371(2) | (i) යම්කිසි කාර්යයක් සඳහා දෙනු ලබන අත්තිකාරම් මුදලක් එම කාර්ය නිම වූ වහාම පියවිය යුතු වුවද අවස්ථා 08 කදී ලබාගත් රු.432,566 ක්වූ අත්තිකාරම් පියවීම මාස 1 සිට 6 අතර කාල පරාසයක් තුළ සිදුකර තිබුණි. |
| | | (ii) අත්තිකාරම් මුදලක් ලබාදිය යුත්තේ මාණ්ඩලික නිලධාරියෙකුට වුවද, මාණ්ඩලික නොවන නිලධාරීන් සඳහා අත්තිකාරම් ලබා දී තිබුණි. |
| | | (iii)අත්තිකාරම් මුදල රු.20,000 නොඉක්මවිය යුතු වුවද, මෙම සීමාව ඉක්මවා අවස්ථා 11 දී රු.996,197 ක මුදලක් ලබා දී තිබුණි. |
| | (iv) මු.රෙ 756,757 | ප්‍රධාන කාර්යාලය හා වතුයායන්හි පවතින මානව හා භෞතික සම්පත් හා තොග වාර්ෂිකව සමීක්ෂණය කර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| | (v) මු.රෙ 1646 | ප්‍රධාන කාර්යාලය හා වතුයායන්ට අනුයුක්ත වාහන වල ගමන් පිළිබඳ දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (උ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 2012 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.2,095,927,194 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ගිණුම් තැබීමක් හෝ වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඌ) | 1985 දෙසැම්බර් 20 දිනැති අංක 319 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ශ්‍රී ලංකා යුධ හමුදා ස්වේච්ඡා බලසේනාව වෙත නිදහස් කර ඇති විධායක තේ රස පරීක්ෂකවරයාගේ සේවය මුල් දින 60 න් ඔබ්බට ලබා ගන්නේ නම් සිවිල් බලධාරීන් විසින් එම තැනැත්තාට ගෙවනු ලබන වැටුප් හා දීමනා සන්නද්ධ බලධාරීන් විසින් නැවත එම සිවිල් බලධාරීන්ට ගෙවිය යුතු වුවද, ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් 2007 ජනවාරි සිට 2012 දෙසැම්බර් දක්වා ගෙවා තිබූ වැටුප් හා දීමනා රු.2,151,795 ක් ශ්‍රී ලංකා යුධ හමුදාවෙන් ප්‍රතිපූරණය කරගෙන නොතිබුණි. |
| (එ) | 1990 ඔක්තෝම්බර් 10 දින අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ප්‍රධාන කාර්යාලයේ සහ වතු යායන්ට අනුයුක්ත වාහන වලට අදාලව මාස 06 කට වරක් ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. |
| (ඒ) | 2008 ජූලි 28 දින අංක පීඊඩී 39 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | හිමිකම් නොමැති නිලධාරී 06 දෙනෙකු සඳහා ප්‍රවාහන හා ඉන්ධන දීමනා ලෙස රු.333,500 ක් වර්ෂය තුළ ගෙවා තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතු වලින් රු.199,543,725 ක පාඩුවක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පාඩුව රු.257,823,702 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේදී රු.58,279,977 කින් අලාභය අඩු වී තිබුණි. නිෂ්පාදන පිරිවැය සියයට 5 කින් අඩුවීමත් මෙහෙයුම් හා මූල්‍ය වියදම් සියයට 10 කින් අඩුවීමත් අලාභය අඩුවීමට හේතු වී තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය තත්ත්වය

| | 2012 | 2011 |
|---|---|---|
| ජංගම අනුපාතය | 1: 2.4 | 1: 2.4 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 1: 2.8 | 1: 2.6 |

2.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

මණ්ඩලයට එරෙහිව බාහිර පුද්ගලයින් හා ආයතන විසින් නඩු පවරා තිබුණු අතර, ඒ සඳහා නීතිඥ ගාස්තු ලෙස සමාලෝචිත වර්ෂය තුල රු.2,202,488 ක් ගෙවා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුළදී තේ වතු 16 ක් හා එක් රබර් වත්තක කටයුතු පවත්වාගෙන ගොස් තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ වතු අංශය ලැබූ පාඩුව රු.226,476,498 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ එය රු.269,013,709 ක් විය. එබැවින් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පාඩුව සියයට 15 ක අඩුවීමක් පෙන්වීය.

(ආ) මණ්ඩලය විසින් තේ කිලෝ එකක් නිපදවීමේදී දැරීමට සිදුවන මූලික පිරිවැය, තේ කිලෝ එකක විකුණුම් ආදායමෙන් ආවරණය කරගත නොහැකි තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය. ඒ අනුව 2010,2011 හා 2012 වසර වල කිලෝ එකක නිෂ්පාදන පිරිවැය (COP) කිලෝ එකක සමාන්‍ය විකුණුම් වටිනාකම (NSA) හා ඒකක දායකය සැසඳීමේදී කිලෝ ග්‍රෑම් එකක දායකයේ අලාභය රු.13 සිට රු.469 දක්වා වූ පරාසයක පැවතුණි.

(ඇ) තේ පර්යේෂණ ආයතනයේ ප්‍රමිතීන්ට අනුව මැදරට තේ හෙක්ටයාරයකට සාමාන්‍ය ඵලදාව (නිමි තේ) කිලෝ ග්‍රෑම් 1200 ක් පමණ වේ. ඒසේ වුවත් මණ්ඩලයේ වතු 16ක තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේදී ඵලදාව කිලෝ ග්‍රෑම් 198 සිට කිලෝ ග්‍රෑම් 1008 දක්වා පරාසයක් තුල තිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හෝප් වතුයායේ තේ නිෂ්පාදනයේදී මුළු නිෂ්පාදනයෙන් සියයට 70 ක් පමණ සාමාන්‍යයෙන් ප්‍රධාන නිෂ්පාදන කාණ්ඩයෙන් විය යුතු වුවද මෙම කර්මාන්ත ශාලවේ පවතින දුර්වලතා හා තේ දළු වල ගුණත්වය අඩු මට්ටමක පැවතීම නිසා ප්‍රධාන නිෂ්පාදන කාණ්ඩයෙහි දායකත්වය මුළු නිෂ්පාදනයෙන් සියයට 50 ක් දක්වා පහත බැස තිබුණි.

(ආ) පැල තවානක් ආරම්භ කර එය මාස 09 ක් ගතවීමෙන් පසු ක්ෂේත්‍රයේ රෝපණය කළ හැකි වුවත් රොක්වුඩ් වතුයායේ වර්ෂ 2009 හා 2010 වර්ෂ වල ආරම්භ කරන ලද පැල තවාන් වල පැල 53,113 ක් දැනටත් තවාන් මට්ටමේම පවතී. එම තවාන් වලින් නිසි කාලයේ පැල ඉවත් කර ක්ෂේත්‍රයේ රෝපණය කිරීමට කටයුතු කළේ නම් මේ වන විට ඵල දරනු ලබන තේ අක්කර 04 ක භූමි ප්‍රමාණයක් සංවර්ධනය කිරීමට තිබුණි.

(ඇ) රහතුන්ගොඩ වතුයායේ මනු රහිතව වතු නිල නිවාස 5 කට හා වතු කාර්යාලය වෙත විදුලිය සැපයීම තේ කර්මාන්තශාලාවට සපයා ඇති විදුලි සම්බන්ධතාවය මඟින් සිදුකර තිබීම හේතුවෙන් ගෘහස්ත පාරිභෝජනයන් වෙනුවෙන් වාණිජ රේටය මත ගෙවීම් කිරීමට මණ්ඩලයට සිදු වී තිබුණි.

(ඈ) වතුයායන්හි ඇති ඉන්වෙන්ට්‍රි අයිතම හඳුනාගත හැකි පරිදි විධිමත් ක්‍රමයකට ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) හෙක්ටයාර 990 කින් යුක්ත කන්දල්ඔය වතුයායේ තේ වගාව සඳහා හෙක්ටයාර 141 ක් යොදා ගෙන තිබුණද ඉතිරි හෙක්ටයාර 849 ක් ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඊ) අනුමැතියක් හා අයවැය ප්‍රතිපාදන නොමැතිව 2010 වර්ෂයේදී රු.2,593,180 ක ප්‍රාග්ධන වැයක් දරා හෝප් වතුයාය තුළ ආරම්භ කර තිබූ පානීය ජල බෝතල් කිරීමේ ව්‍යාපෘතිය මඟින් ජල බෝතලයක් නිෂ්පාදනය කිරීමේ දළ පිරිවැය රු.17.90 ක් විය. එසේ වුවද අලෙවි කිරීමේදී රු.14 සිට රු.35 දක්වා වූ විවිධ මිල ගණන් වලට අලෙවි කර තිබුණි. තවද පිරිවැයකරණයේදී ගිණුම් ඒකකයක් ලෙස සලකා ගිණුම්ගත නොකිරීම හා මිල කිරීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(උ) 1982 මාර්තු 01 දිනැති හා 183/10 දරන ගැසට් පත්‍රය මඟින් රුකතැන්න වතුයායේ හෙක්ටයාර 310 ක් ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත පවරා දී තිබුණි. රුකතැන්න වතුයාය 1992 වර්ෂයේ වතු ප්‍රාදේශීය වැවිලි සමාගම්වලට පවරා දීමේදී හෙක්ටයාර 299 ක් පමණක් භාර දී තිබුණු බැවින් ඉතිරි හෙක්ටයාර 11 ක භූමි ප්‍රමාණයට කුමක් සිදුවූවාද යන්න විගණනයට සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අනාගත නිෂ්පාදන අලෙවිකර මුදල් පියවීමේ පොරොන්දුව මත තැරැව්කාර ආයතන වෙතින් ලබාගත් අත්තිකාරම් මුදල් 2012 දෙසැම්බර් 31 දිනට රු.137,450,440 ක් විය. මේ සම්බන්ධයෙන් අයකරගන්නා පොලී අනුපාතය හා අනෙකුත් කොන්දේසි පිළිබඳව දෙපාර්ශවය අතර ලිඛිත එකඟතාවයක් නොතිබුණි. එක් එක් තැරැව්කාර ආයතන වෙනුවෙන් වෙන වෙනම ගිණුම් තැබීමට හා එම ණය මුදල් වෙනුවෙන් අයකල පොළිය වෙනම හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2000 වර්ෂයේදී හන්තාන වත්තෙන් කොටසක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට පවරා දීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙන් රු.50,000,000 ක මුදලක් ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් ලබාගෙන තිබුණි. විවිධ හේතූන් මත ආයෝජන මණ්ඩලය වෙත එම ඉඩම පවරා දීමට නොහැකි වී තිබුණු අතර ඒ සඳහා විකල්ප ඉඩමක් සපයා දීමට එකඟ වී තිබුණි. එසේ වුවද 2012 දෙසැම්බර් 31 දිනටත් මෙම තත්ත්වය නිරාකරණය වී නොතිබුණි.

(ඇ) අනාගතයේදී ඉඩම් කොටස් බදුදීමේ අදහස ඇතුව බාහිර පාර්ශවයන්ගෙන් අත්තිකාරම් ගැනීම සමාලෝචිත වර්ෂයේදී රු.82,277,889 ක් විය. මෙම අත්තිකාරම් මුදල් ගැනීමේදී බදුදීමට අදාළ දේපළ නිශ්චය කිරීම, ඒ සඳහා ලබාගත් අමාත්‍යාංශ ඉඩම් කමිටු නිර්දේශය, බදු ගැනීමට අපේක්ෂිත පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති ව්‍යාපෘති ඇගයීම් වාර්තා,තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තක්සේරු නිවේදන හා බදුකරු තෝරාගත් පදනම යනාදී මූලාශ්‍ර තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

3.4 දෘෂ්‍ය අක්‍රමිකතා

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හෝප් වතුයායේ සහ කන්දල්ඔය වතුයායේ සේවකයින් නොවන සමෘද්ධි නිලධාරියෙකුට සහ පාසල් ගුරුවරුන් තිදෙනෙකුට වතුයායන්ට අයත් නිල නිවාස 4 ක් පදිංචිය සඳහා ලබා දී තිබුණි.

(ආ) 1996 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා වරින් වර පුද්ගලයන් 13 දෙනෙකු විසින් කන්දල්ඔය වතුයායට අයත් ඉඩම් කොටස් 13 කට අයත් හෙක්ටයාර 59.14 ක් අධිකාරී බලයක් නොමැතිව භුක්ති විඳිමින් පැවති අතර මෙම ඉඩම් නැවත වතුයාය වෙත අත්පත් කර ගැනීමට කළමනාකරණය අසමත් වී තිබුණි.

(ඇ) රහතුන්ගොඩ වතුයායේ අක්කර 35 කට වඩා වැඩි භූමි ප්‍රමාණයක් අවස්ථා 23 කදී විවිධ පාර්ශව විසින් නිසි අවසරයකින් තොරව භුක්ති විඳිමින් තිබුණු අතර ඒ සම්බන්ධයෙන් ආයතනය මෙතෙක් නිසි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.5 ආර්ථික නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සේවක භාරකාර අරමුදල්, පාරිතෝෂිත , වතුසේවක අර්ථසාධක අරමුදල් හා ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක අරමුදල් නිසි පරිදි නොගෙවීම නිසා වර්ෂය තුලදී අධිභාර වශයෙන් පිළිවෙලින් රු.1,136,967 , රු.5,087,836 , රු.70,213, රු.248,399 වශයෙන් එකතුව රු.6,543,415 ක් ගෙවා තිබුණි.

(ආ) විදුලි බිල්පත් ගෙවීම ප්‍රමාද වීම නිසා වතුවලට අදාලව රු.1,037,674 ක දඩ මුදලක් ගෙවා තිබුණි.

3.6 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජන වත්කම්

කන්දල්ඔය වතුයායේ තේ කර්මාන්තශාලාව මීට වසර 10 කට පමණ පෙර සිට වසා දමා ඇති අතර එහි සේවය කළ වසර 60 ක් ඉක්ම වූ සේවකයින් තිදෙනෙකු ඵලදායී සේවාවක් ලබාගැනීමකින් තොරව වැටුප් ලබමින් සිටී. මෙම සේවකයින් සඳහා පසුගිය වසර 10 ක කාලය තුල වැටුප් හා දීමනා ලෙස රු.7,742,280 ක මුදලක් ගෙවා තිබුණි.

3.7 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හෝප් වතුයායේ පානීය ජල බෝතල් ව්‍යාපෘතියෙන් 2012 වර්ෂයේදී අනාවරණය වූ ශුද්ධ අලාභය රු.2,785,659 ක් වූ අතර, කල් ඉකුත් වීම නිසා විනාශ කළ බෝතල් වල වටිනාකම රු.80,000 ක් විය. තවද 2012 වර්ෂයේදී හෝප් වතුයායෙන් ප්‍රධාන කාර්යාලය වෙත එවන ලද පානීය ජල බෝතල් ප්‍රමාණය හා ප්‍රධාන කාර්යාලය වෙත ලැබුණු බෝතල් ප්‍රමාණයන් අතර බෝතල් 7730 ක අඩුවීමක් නිරීක්ෂණය වූ අතර එහි වටිනාකම රු.126,772 ක් විය.

(ආ) ලොරි රථයක් අනතුරකට භාජනය වීම හේතුවෙන් එහි අළුත්වැඩියා කටයුතු සඳහා අනුමත මුදලට වඩා රු.523,905 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) ක්‍රියාත්මක තත්ත්වයේ ඇති කර්මාන්ත ශාලා නිසි පරිදි නඩත්තු නොකිරීම නිසා එම කර්මාන්ත ශාලා වලින් නිපදවනු ලබන තේ ලංකා තේ වෙන්දේසියේදී ඉතා පහළ මිල ගණන් වලට අලෙවි වන අතර, මිල මත ශ්‍රේණිගත කිරීම් වලදී එම කර්මාන්තශාලා පිහිටි නිෂ්පාදන ප්‍රදේශයේ ක්‍රියාත්මක වන සෙසු කර්මාන්තශාලා හා සැසඳීමේදී ඉතාමත් පහළ ශ්‍රේණිගත කිරීම් වල දිගින් දිගටම රඳා පැවතුණි.

(ඈ) බාහිර පාර්ශවය විසින් මණ්ඩලයේ වතුයායන් වල විශාල කොටසක් බලෙන් අල්ලාගෙන ඇති බවට මාගේ ඉකුත් වර්ෂවල වාර්තාවලින් පෙන්වා දී ඇති අතර සභාපතිගේ පිළිතුර මඟින් එම අනවසර පදිංචිකරුවන්ගේ ලේඛනයක් පිළියෙල කර ඇති බවත් ඉදිරියේදී ඔවුන්ට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බවත් වාර්තා කළද එම ක්‍රියාමාර්ගයන්හි සැලකිය යුතු ප්‍රගතියක් විගණනයට නිරීක්ෂණය නොවුණි.

(ඉ) රහතුන්ගොඩ වතුයායේ, 2006 වසරේදී ක්‍රියාත්මක කරන ලද කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා රු.45,710 ක් වැය කර තිබුණි. 2012 වර්ෂය අවසානයේ භෞතිකව නොතිබුණු මෙම තොගය අවසන් ගිණුම් තුළ ජංගම වත්කම් ලෙස පෙන්වා තිබුණි.

(ඊ) මුල්හල්කැලේ වතුයායේ 2010 ජනවාරි සිට 2013 මැයි දක්වා කිසිදු ආදායමක් නොලබා සේවක වැටුප් ලෙස රු.13,404,948 ක් ගෙවා තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත වාර්ෂික ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද මණ්ඩලය විසින් 2012 වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කර තිබුණේ 2013 ජූලි 04 දිනදීය. 2005 වර්ෂයේ සිටම මෙසේ ගිණුම් ප්‍රමාද වී ඉදිරිපත් කර තිබුණි.

### 4.2 සංයුක්ත සැලැස්ම

2011-2013 දක්වා වූ සංයුක්ත සැලැස්ම පිළියෙල කර තිබුණද, ආයතනයේ පවතින අයහපත් මූල්‍ය තත්ත්වය හේතුවෙන් මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ කටයුතු අත්හිටුවීමට 2011 ඔක්තොබර් 07 දින රැස්වූ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි.

### 4.3 ක්‍රියාකාරී සැලැස්ම

2012 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සංයුක්ත සැලැස්මට සමගාමීව ක්‍රියාත්මක කර නොතිබුණි.

### 4.4 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මක වුවත්, අභ්‍යන්තර විගණන සැලසුම් හා විගණන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

4.5 විගණන කමිටු

විගණන කමිටුවක් පිහිටුවා තිබුණද සමාලෝචිත වර්ෂය සඳහා එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණි.

5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු විය යුතුව ඇත.

(i) පොත්පත් හා ලේඛන පවත්වාගෙන යාම

(ii) බදුකුලී ආදායම් එකතු කර ගැනීම

(iii) ගිණුම්කරණය

(iv) ණයගැතියන් හා ණය හිමියන්

(v) ස්ථාවර වත්කම්

(vi) ආදායම්